සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**47 | S | I, II**

42924

# අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2021(2022)
# கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2021(2022)
# General Certificate of Education (Ord. Level) Examination, 2021(2022)

**සිංහල සාහිත්‍ය රසාස්වාදය I, II**
இலக்கிய நயம் சிங்களம் I, II
Appreciation of Sinhala Literary Texts I, II

**පැය තුනයි**
மூன்று மணித்தியாலம்
*Three hours*

**අමතර කියවීම් කාලය - මිනිත්තු 10යි**
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**විභාග අංකය :** ......................................

**උපදෙස්:**

- ※ I හා II පත්‍රය සඳහා පිළිතුරු සපයා සම්පූර්ණ කාලය අවසානයේදී වෙන වෙන ම භාරදිය යුතු ය.
- ※ I පත්‍රය සඳහා පිළිතුරු මෙම පත්‍රයේම ලිවිය යුතු ය.
- ※ II පත්‍රය සඳහා පිළිතුරු සැපයීමට උත්තර ලියන පොත භාවිත කරන්න.
- ※ I පත්‍රය සඳහා ලකුණු **40**ක් ද II පත්‍රය සඳහා ලකුණු **60**ක් ද හිමි වේ.

## සිංහල සාහිත්‍ය රසාස්වාදය - I පත්‍රය

(**සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේ ම සපයන්න.)

**1.** (i) සිට (v) තෙක් ඇති කොටස් කියවා, ඒවා ඇසුරින් අසා ඇති (අ), (ආ) ප්‍රශ්නවලට **කෙටි පිළිතුරු** ලියන්න.

(i) "ඉදින් මූ උන් දිටුහු නම් එක දවසකුත් නොරඳා පලා යන්නා හ."

(අ) මෙම ප්‍රකාශය කළේ කවරෙක් ද?

..........................................................................................

(ආ) මෙහි 'මූ' යන්නෙන් අදහස් වන්නේ කවරෙක් පිළිබඳ ව ද?

..........................................................................................

(ii) "මා ශාසනයෙහි ඇලුම් නැත. සිවුරු හරිමි."

(අ) මෙම ප්‍රකාශය කළේ කවරෙක් ද?

..........................................................................................

(ආ) මෙම පාඨය ඇතුළත් මුල් කෘතිය නම් කරන්න.

..........................................................................................

(iii) "මම නං කැමති ටෙක්නිකල් කොලීජියට යන්ඩ."

(අ) මෙම ප්‍රකාශය කළේ කවරෙක් ද?

..........................................................................................

(ආ) මෙම පාඨය ඇතුළත් කෘතිය නම් කරන්න.

..........................................................................................

[දෙවැනි පිටුව බලන්න.

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

**2.** පහත දැක්වෙන ගද්‍ය-පද්‍ය කොටස් දෙකෙන් **එක්** කොටසකට **පමණක්** පිළිතුරු සපයන්න.

"තව ද ප්‍රභාවතීනි, තෙපි යම් පමණ කලක් කෝපයෙන් බැම බිඳ රූෂ්ටව බලන්නී ද ඒ තාක් මදු රජ්ජුරුවන්ගේ මේ භවනයෙහි දුක් විඳිමින් අරක්කැමිව වාසය කෙරෙමි. යම් කලෙක්හි සිනා පහළ කර ස්නිග්ධ වූ නිරීක්ෂණයෙන් සතුටුව බලන්නෙහි ද එකල චිත්ත සන්තාපයන් දුරු කොට රාජශ්‍රීයට පැමිණියාක් මෙන් වෙමි. එහෙයින් සොඳුර මෙතැන් පටන් මෙබඳු වූ තදමන් නො කරව" යනාදීන් යාඥා කීවාහු ය.

එබස් අසා ප්‍රභාවතී තොම මෙතෙම වඳුරු ලාවෙහි බැඳුණු වානරයක්හු පරිද්දෙන් මා කෙරේ ඉතා ශක්තව කියන්නේ ය. උපදෙසකින් බොරුවක් කියා මෙයින් නික්මවමී සිතා "මහරජ, කුස රජ්ජුරුවන් වහන්සේ මට ස්වාමි වන සේක් ද නො වන සේක්දැයි නිමිත්ත විචාළ තෙන ඒ නිමිත්ත පාඨකයෝ නුඹ වහන්සේ සත්කඩක් කොට කැපුවත් උන් වහන්සේට අග මෙහෙසුන් වන්නේ නැතැයි තරයේ ම කිවූ ය. එහෙයින් නොයෙක් කාරණයෙන් නො කැමති වූ මා නිසා දුක් නො විඳ නුඹ වහන්සේගේ රටට ම පලා ගිය මැනවැ"යි කිවූ ය. ඒ අසා කුස රජ්ජුරුවෝත් ඔවුන්ට කී බස් ප්‍රත්‍යුත්තරයෙන් ම පසුබස්වමින් "සොඳුර, මා විසිනුත් නිමිත්ත විචාළ තැන මාගේ රට නිමිත්ත පාඨකයෝ තොප විනා උන්ට වල්ලභ කෙනෙක් නැත්තාහයි තරයේ ම කිවූ ය. එකී නිමිත්තයෙනුත් මා දුටු කාරණයෙනුත් මා විනා තොපට අනික් වල්ලභ කෙනෙක් නැත. ඒ කාරණයෙන් තොපගේ තද මන් හැර පියව"යි කීහ.

ප්‍රභාවතී කුස රජ්ජුරුවන්ගේ බස් අසා කවර ලෙසකිනුත් මුන් ලජ්ජාවට පමුණුවාගත නො හැක්කේ ය. යේවා නො යේවා මට නම් කම් කිම් ද සිතා දොර අගුළු ලා ගත්තු ය. එකල බෝධිසත්වයෝ වළන්කද කර තබාගෙන පලා ගියාහු ය.

(i) කුස රජ පබාවතිය කෙරෙහි පැවති තදබල ප්‍රේමය පිළිබිඹු වන අවස්ථා **දෙකක්** මෙම ඡේදය ඇසුරෙන් ලියන්න.

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

.............................................................................................................. (ලකුණු 04යි.)

(ii) මෙම උද්ධෘතයට අනුව කුස රජ අධෛර්ය කිරීමට පබාවතිය යෙදූ උපක්‍රමය කුමක් ද?

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

.............................................................................................................. (ලකුණු 04යි.)

(iii) පබාවතියගේ උපායට කුස රජ යෙදූ ප්‍රතිඋපාය කුමක් ද?

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

.............................................................................................................. (ලකුණු 06යි.)

(iv) මෙම උද්ධෘතයට අනුව කුස රජතුමාගේ යාඥාව කෙරෙහි පබාවතිය දැක් වූ අවසන් ප්‍රතිචාරය කුමක් ද?

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

.............................................................................................................. (ලකුණු 06යි.)

[හතරවැනි පිටුව බලන්න.

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**47 | S | I, II**

42924

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2021(2022)
General Certificate of Education (Ord. Level) Examination, 2021(2022)

| | |
|---|---|
| සිංහල සාහිත්‍ය රසාස්වාදය | I, II |
| இலக்கிய நயம் சிங்களம் | I, II |
| Appreciation of Sinhala Literary Texts | I, II |

## සිංහල සාහිත්‍ය රසාස්වාදය - II පත්‍රය

※ **පළමුවන** ප්‍රශ්නය ද, **2, 3, 4, 5** ප්‍රශ්නවලින් තෝරාගත් ප්‍රශ්න **දෙකක් ද ඇතුළු ව ප්‍රශ්න තුනකට** පිළිතුරු සපයන්න.

※ මෙම පත්‍රය සඳහා පිළිතුරු සැපයීමට පිළිතුරු ලියන පොත භාවිත කරන්න.

**1.** පහත සඳහන් පැදි පෙළ කියවා දී ඇති ප්‍රකාශ උපයෝගී කොට ගෙන, වචන **200**කින් පමණ රසාස්වාදයක් ලියන්න.

ගොඩේ කන්දෙ මූකලාන කම්පා කරමින්නේ
රුස්සයෙකි ඊ පාළුව බිඳගෙන ඇද වැටුණේ
අඩ නින්දෙ ම පන් පැදුරට උණු කඳුළක් හැලුණේ
මූකලාන පස් වැටියක් වී හීනෙන් පෙනුණේ

යස දරුවන් ගෙන ඇකයෙන් කැපුවත් නොසැලෙන්නේ
දුක් කරදර කෝටියක් ම ගිලගෙන හිනැහෙන්නේ
සියතින් මර විපත කටින මිනිසුන් දකිමින්නේ
මහා පුරුෂයකු වාගේ කන්ද නැගී ඉන්නේ

පිරුණු ලොරිය ගම් දොරකඩ පියමං කර යනවා
පාර වුණත් හිරිහැරයක් නෑ ඔහෙ නිදියනවා
පැලේ වහල ඇද හැළිලා මාසයක් ම වෙනවා
පරාල තුනකට අයියා හිරේ හුහුං ලනවා

පොරොව, කියත කලුවරේ ම පණ ආවා ලෙසිනේ
මගෙ ඇඟ උඩ පට්ටල් බැඳ කපනු ඉරනු වැන්නේ
දෙයියන්ගේ මල්ලිලාට දෙවියො ම රැවටෙන්නේ
කාන්තාර ගම මායිම් තවත් පුළුල් වෙන්නේ

(අ) මෙම පැදි පෙළට පාදක වූ අත්දැකීම
(ආ) එම අත්දැකීම ප්‍රතිනිර්මාණය සඳහා කවියා යොදා ගත් සිද්ධි හා අවස්ථා
(ඉ) මෙම පද්‍ය පන්තියේ භාෂා භාවිතය
(ඊ) මෙම පද්‍ය නිර්මාණයේ භාවිත ආකෘතිය
(උ) සමාජයේ පවතින ඇතැම් අකටයුතු කෙරෙහි කවියා දක්වන විරෝධය (ලකුණු 06 × 5 = 30යි.)

[හයවැනි පිටුව බලන්න.

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/